# 05

**Samodhana: The Journal of Humanities and Social Sciences**
2017, Vol.6 (II) 61-78pp
© The Author 2017
Ed. *Chandana Rohana Withanachchi*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# ධාතුගර්භ සිතුවම්හි මිහින්තලා ලකුණ -මිහින්තලය ධාතුගර්භ චිත්‍ර හා එහි කලාත්මක අගය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.ඒ. ප්‍රසාද් කුමාර[1]

**Abstract**

The idia of drawings interior of the stupa in ancient Sri Lanka Stupa History has revealed through legends such as Mahawansa,Deepawansa and has been confirmed by archeological evidences.The news that drawings were in the interior side walls of Maha Stupa built by King Dutugemunu in the Anuradhapura Era has proven archeologically.The religious site of Mihinthalawa has been identified as a plase where the evidences found to prove the drawings inside the stupa in the era of Anuradhapura ancient Arts.Even though this is a place with few ancient arts another few drawings have been found from a mining at an ancient stupa located in the north of Stupa Kantaka and Maha Stupa.Those arts recovered as pioneered by Senarath Paranawitana in 1951 are kept in the Mihinthala Museum for public exposition.A study on the artistic value and the theme of the Mihinthala arts belong to the 08 A.D is done through this article.

**Key words:** Mihintale, Stupa, Mahawamsa, Kantaka Stupa

[1] *සහකාර කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.*

### හැඳින්වීම

ලාංකේය බිතුසිතුවම් කලාවෙහි ඓතිහාසික පරිණාමය තුළ මිහින්තලය ධාතුගර්භ සිතුවම් ඊට හිමිවිය යුතු අවකාශීය සන්දර්භයෙහි තවමත් ස්ථානගත කොට නැත. එහි කලාත්මක පැතිකඩ වුව සාකච්ඡාවට බඳුන් වී ඇත්තේ ඉතා සංක්ෂිප්ත වශයෙනි. නැතහොත් වෙනත් සිතුවමක් විස්තර කිරීමට යොදාගත් ආධාරකයක් වශයෙනි. එහෙත් මෙරට බිතුසිතුවම් කලාවේ ආරම්භය, විශේෂයෙන් එහි ක්‍රමික විකාශනය පිළිබඳ සාකච්ඡාවේදී තත් සිතුවම් කෙසේවත් නොසළකා හැරිය හැකි නොවේ. මිහින්තලය වූ කලී පැරණි සිංහල චිත්‍ර අඩු වශයෙන් පිහිටි ස්ථානයක් වශයෙන් සැළකිය හැකි වුවත් කණ්ඨක චෛත්‍ය හා මහාසෑයට උතුරින් පිහිටි පුරාණ දාගැබක් කැණීමේ දී ධාතු ගර්භයේ තිබී චිත්‍ර කිහිපයක් සොයාගත් පසු එම සිතුවම් පොදුවේ මිහින්තලා ධාතු ගර්භ චිත්‍ර ලෙස හඳුන්වා ඇත. සෙනරත් පරණවිතාන ශූරින්ගේ මූලිකත්වයෙන් වර්ෂ 1951 දි පමණ අනාවරණය කරගත් ධාතු ගර්භ චිත්‍ර හා එහි කලාත්මක අගය පිළිබඳ ව විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාව ට ලක් කිරීම මෙම අධ්‍යනයෙන් සිදු කෙරේ.

### ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේදී මූලික වශයෙන් පුස්තකාල පරිශීලනය කරන ලද අතර ඒ යටතේ ප්‍රස්තුතයට අදාළ ව මෙතෙක් පළ වී ඇති ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනයට ලක් කෙරිණි. යට සඳහන් කර ඇති පරිදි ඊට උපකාර වන පූර්ව පර්යේෂණ ඉතා සීමිත වෙයි. තත් සිතුවම්හි වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම පිණිස වත්මන් ලේඛකයා විසින් මිහින්තලය කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ධාතුගර්භ චිත්‍ර පරීක්ෂා කරන ලද්දේ ය. ඒ අනුව දෘනට දක්නට ලැබෙන සිතුවම් දිශානුගතව ඡායාරූප ගතකොට නැවත විමර්ශනය කෙරිණි. සමකාලීන වෙනත් සිතුවම් පිළිබඳ ව සිදුකර ඇති අධ්‍යයන තුළනාත්මක විමර්ශනය පිණිස යොදා ගනු ලැබු අතර එම සියලු දත්ත පදනම් කොටගෙන ප්‍රස්තුතය විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාවට බඳුන් කිරීම මෙහි ක්‍රමවේදය වෙයි.

## මිහින්තලා ධාතු ගර්භ චිත්‍ර පිළිබඳ පූර්ව වාර්තාකරණ

ශ්‍රී ලංකාවේ සිතුවම් කලාවේ ආරම්භය ඓතිහාසික යුගයෙන් ඈතට නොයයි. වර්ණාලේප සම්බන්ධ ව යම් දැනුමක් මධ්‍ය ශිලා යුගයේ මානවයා සතුව තිබුණු බවට නිසැක සාධක ඇතත් (Deraniyagala 1992 : 276, 278, 311, 696) එය සිතුවම් කලාවක් ඔවුන් සතුව තිබූ බවට ප්‍රමාණවත් සාධකයක් නොවේ. මුල් ඓතිහාසික යුගයේදී සිතුවම් කලාව බෞද්ධාගම හා මුහුවෙමින් ක්‍රියාකාරි වූ අතර බෞද්ධ සංස්කෘතියෙන් පරිබාහිර වූ සිතුවම් කලාවක් පිළිබඳ කතා කළ නොහේ. කණ්ඨක චෛත්‍යයේ ආයක මත දක්නට ලැබෙන සිතුවම් ශේෂ මේ පිළිබඳ පැරණිතම සාධක සපයයි. ථේරවාදීන් නිදහස් සිතුවම් කලාවකට උචිත පරිසරය සකස් කරදුන් හෙයින් ම ක්‍රි.ව. 4,5 සියවස් පමණ වන විට බෞද්ධ ලෙන් සිතුවම් කලාවක් බිහිවනු දැකිය හැකි විය. ධාතු ගර්භයන් ආශ්‍රිත ව පවා සිතුවම් නිර්මාණය කිරීමට ඔවුන් තුළ නැඹුරුවක් ඇති වූ බව පෙනේ. අනුරාධපුර යුගයෙහි සිතුවම් අතර සුවිශේෂී සිතුවම් කඩක් ලෙස මිහින්තලා ධාතු ගර්භ චිත්‍ර අපගේ විමර්ශනයට ලක් වේ.

මිහින්තලා ධාතු ගර්භ චිත්‍ර පිළිබඳ ව මුල්ම වර්තාකරණයක් සිදු කරන ලද්දේ 1951 වර්ෂයෙහි සෙනරත් පරණවිතාන ශූරින් (1972 : 91-94) විසිනි. ඔහු විසින් ඝන කැලැවෙන් වැසී තිබුණු සණ්ඨක චෛත්‍ය හා මහාසෑයට උතුරින් පිහිටි පුරාණ දාගැබ සොයාගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස එහි ධාතු ගර්භයේ බිත්ති තුනක (03) ඇඳ තිබූ සිතුවම් කිහිපයක් සොයාගැනීමට සමත් විය. හෙතෙම සිය සොයා ගැනීම පිළිබඳ සඳහන් කරමින් "පුරාවිද්‍ය පර්යේෂණ" නම් කෘතියෙහි "මිහින්තලය පැරණි බිතුසිතුවම් සොයා ගැනීම" නමින් විස්තරයක් සපයා තිබේ (1972:91-94). තත් සිතුවම් පිළිබඳ වැදගත්කම විශේෂයෙන් පෙන්වාදෙන ලද්දේ එස්.පී.චාර්ල්ස් (2000 : 10-11) විසිනි. මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් ප්‍රකාශයට පත්කරන ලද "පාරම්පරික සිංහල බිතු සිතුවම්" නැමැති ග්‍රන්ථයට "මිහින්තලේ චිත්‍ර" නමින් වූ ලිපිය රචනා කරමින් " පුරාවිද්‍යාව නිතරම උත්සාහ කරන්නේ කාලය පිළිබඳ නිගමනයකට බැසිමට ය. ඉතිහාසය පිළිබඳ දැනීම ඔහුට ඉතා වැදගත් ය. ලලිත කලාකාරයකුට චිත්‍රය හෝ මූර්ති පිළිබඳ උගනීමේ දී පරපුරෙන් පරපුරට ඒ කෘතිය වෙනස් වෙමින් ආ අයුරු, සාම්ප්‍රදායික ලක්ෂණ මාධ්‍යය ක්‍රමය හා ශිල්පී ධර්මයන් පිළිබඳ දැනීම ප්‍රයෝජනවත්ය" යනුවෙන් සඳහන් කර තිබේ (චාර්ල්ස් : 2000: 11). මේ

සිලු චිත්‍රයන් ඔහු විසින් හොඳින් පරීක්ෂා කර බලා මේ විස්තර ගෙන එන බව වැඩිදුරටත් සඳහන් කර ඇත. පසුකාලීනව ඒ පිළිබඳ අදහස් දැක්වූවන් අතර මහාචාර්ය එම් සෝමතිලක (2004: 56), නන්දේව විජේසේකර (1964 : 11-12) ආදීහු වෙති.

## මිහින්තලා ධාතු ගර්භ සිතුවම් සොයා ගැනීම

පාලි ග්‍රන්ථයන්හි මිස්සක පබ්බත යන නමින් හැඳින්වෙන මිහින්තලා පුදබිම ආශ්‍රිත ව තිබී මෙම ධාතු ගර්භ චිත්‍ර හමු වී තිබේ. දෙවනපෑතිස් රාජ්‍ය කාලය තෙක් ඈත අතීතයකට දිවයන ඉතා පැරණි සිද්ධස්ථානයක් වන මිහින්තලය කණ්ඨක චෛත්‍ය හා මහාසෑයට උතුරින් පිහිටි දාගැබක් කැණීමේදී එහි ඇතුළු ධාතු ගර්භයෙහි තිබී මෙම සිතුවම් හමු වූ බව යට සඳහන් කෙරිණි. මෙම දාගැබ සොයා ගන්නා මුල් අවධියේ දී ඒ ආසන්නයට යාමට පවා නොහැකි වන තරමට වනගත වී තිබුණු බැවින් (Paranavitharana 1972 : 91 ) සිතුවම් සොයා ගැනීම ද දුෂ්කර එකක් වී තිබේ. වර්ෂ 1951 දී පමණ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ඝන වන රොඳින් වැසී තිබුණු මෙම දාගැබ හෙළි පෙහෙළි කරන ලද අතර පරණවිතානයන් එහි පෙරගමන්කරු වී තිබේ. දාගැබෙහි ඉහළ කොටස කඩා වැටීමෙන් ගොඩනැගී තිබුණු සුන්බුන් ඉවත් කිරීමේ කාර්යය 1951 ආරම්භ කොට නිමකළ පසු පේසාවළලු ඇතුළු පහත කොටස නිර්මාණය දැක ගැනීමට හැකි වූ බව "පුරාවිද්‍ය පරියේසණ" කෘතියේ දැක්වේ (Paranavitharana 1972 : 91 ). ඔහු සඳහන් කරන ආකාරයට ස්තූපය පිහිටි අංගනය වටකුරු ය. එය අවට භූමියට වඩා අඩි 10 ක් උස්ව පිහිටා තිබුණු අතර ඒවායෙහි විෂ්කම්භය අඩි 88 ක් පමණි. එය පොළොන්නරු කිරිවෙහෙරට බොහෝ සෙයින් සමානව තිබෙන්නට ඇති බව සෙනරත් පරණවිතානයන් අනුමාන කරයි (Paranavitharana 1972 : 91 ). තමාගේ නිරීක්ෂණයට ලක්වන විට චෛත්‍යයේ පිහිටීම පිළිබඳ පරණවිතානයන් දක්වා ඇති අදහස් මෙසේ ය.

"මුදුන් පේසාවළල්ලේ මට්ටමේ පිහිටුවා තිබුණු ඉහළ ධාතු ගර්භයේ බිම් සැළැස්ම අඩි දොළහක් හතරැස් විය. එහි උස අඩි 8 කුත් අඟල් 09 ක් විය. එය

වසා තිබුණේ ගල් ලෑලිවලිනි. මෙම ධාතු ගර්භයේ අඩි අඟල් 03 ක් ගැඹුරු, අඩියක දිග පළල ඇති සතරැස් වළවල් විසිපහකට බෙදා තිබිණි. ධාතු ගර්භයේ ඇතුළු බිත්ති සිතුවම් කර තිබී ඇතත් ස්තූපය පැහැර ගැනීමෙන් පසු එම ධාතු ගර්භය කාලයේ පීඩාවලට ගොදුරුවීම නිසා බිත්ති කඩා වැටී ඇති හෙයින් අද දක්නට ලැබෙන්නේ එහි වූ ජීවමාන ප්‍රමාණවල රූපවල පහළ කොටස් පමණකි. ඒවායිනුත් පැහැදිලි ව හඳුනාගත හැක්කේ රූප 28 ක ඉතුරු කොටස් පමණි " (Paranavitharana 1972 : 92 ).

මේ සඳහන අනුව චෛත්‍ය ඉහළ ධාතු ගර්භයෙහි සම්පූර්ණයෙන්ම බදාම පිරියම් කොට එහි ජීවමාන ප්‍රමාණයට ම විශාල වූ බොහෝ සිතුවම් ඇඳ තිබූ බව පෙනේ. මෙම රූපවල දණහිසෙන් පහළ කොටස් පමණක් පැහැදිලි ව ඉතිරි වී තිබෙන අතර සෙසු කොටස් ගැළවී ගොසිනි. රූප 28 ක අවශේෂ කොටස් හඳුනාගත හැකි අතර ඒවා රතු, කහ, සහ කොළ වර්ණයන්ගෙන් වර්ණ ගන්වා තිබුණි. රූප අඹන ලද බවට ද සාක්ෂි පෙනෙන්නට තිබෙන නමුත් අවශේෂ වී ඇත්තේ චිත්‍රවල කාණ්ඩ පමණක් නිසා ඒ පිළිබඳ ව මීට වඩා යමක් ප්‍රකාශ කළ නොහැකි ය. ඉහළ ධාතු ගර්භය නිධන් හොරුන්ගේ ග්‍රහණයට ලක්ව දැඩි ලෙස විනාශ වී ගොස් තිබුණු නිසා එකී චිත්‍ර වලට සිදු වී ඇති හානිය උපරිම වී ඇත. එහෙත් දාගැබෙහි පහළ ධාතු ගර්භයේ බිත්ති සිතුවම් සහිත වූ අතර මේ චිත්‍ර සොයා ගන්නා විටත් යහපත් තත්ත්වයක පැවති බව පරණවිතානයන් සිය නිරීක්ෂණ වාර්තාවල දක්වා තිබේ (Paranavitharana 1972 : 92-93 ). ගරාවැටුණු දාගැබෙහි පහළ ධාතු ගර්භය හා එහි සිතුවම් පිහිටි ආකාරය පිළිබඳ ව සිය නිරීක්ෂණ වාර්තා සෙනරත් පරණවිතාන ශූරීන් "පුරාවිද්‍ය පරියේසණ" නම් කෘතියෙහි දක්වා තිබේ.

"මෙම ගර්භය පිහිටුවා ඇත්තේ දාගැබෙහි පිහිටි අංගනය මට්ටමේ ය. ගර්භය මැද මහාමේරු ගලක් බිම තබා තිබිණ. එහි වටකුරු වළවල් තුනකින් යුතු ගල්කණුවක් ද විය. සුන්බුන් අතර තිබී සම්භ වූ ශ්‍රීවාකාර ගල් දෙකක් මේ ගල්වලට ගැළපෙන බවක් දිස් විය. මෙම ගර්භයේ තිබූ මහාමේරු ආකෘතිය මුක්කු තුනක් උඩ පිහිටුවා තිබෙන්නට ඇති බව මෙයින් පැහැදිලි වේ.... මෙම ධාතු ගර්භ බිත්ති සිතුවම් කර තිබෙනු දක්නා ලදී " (Paranavitharana 1972 : 92) යනුවෙන් වූ සඳහන අනුව පහළ ධාතු ගර්භයේ පිහිටීම හා එහි බිත්ති සිතුවම් සහිත ව නිර්මාණය කර තිබූ ආකාරය හඳුනාගත හැකි ය. තත් සිතුවම්

තවමත් ආරක්ෂිත ව පවත්නා අතර මෙම අධ්‍යයනය සිදු කෙරෙන්නේ එකී සිතුවම් පිළබඳව ය.

පරණවිතානයන් යට සඳහන් කර ඇති විස්තරයේ ගර්භය මැද වූ මහාමේරු ගලක් පිළිබඳ අදහස ඉදිරිපත් කර තිබේ. භාරතීය විශ්ව විරණයට අනුව මෙය විශ්වයේ කේන්ද්‍රස්ථානය ලෙස සැලකෙන මහාමේරු නැමැති මිත්‍යා පර්වතයේ ශෛලිගත නිරූපණයක් වන බව කියැවේ (Paranavithana 1963 : 17 ). දාගැබෙහි ධාතු ගර්භයේ මැද පිහිටි මහාමේරුව මුක්කු තුනක් මත පිහිටුවා තිබෙන්නට ඇතැයි සැක පහළ කරන පරණවිතානයන් එමඟින් පැරණි ජනප්‍රවාදයේ එන මහාමේරුව ත්‍රිකූට පර්වතයක් මත පිහිටියේ ය යන අදහසට සමානත්වයක් දරණ බවට මත පළ කරයි (Paranavithana 1972 : 92 ). මෙම මතය බෙල් මහතා විසින් පිළිගෙන තිබේ (Paranavithana 1963 : 19 ). මිහින්තලා ධාතු ගර්භයෙන් හමු වූ මහාමේරුවට හැම අතින්ම සමාන මහාමේරුවක් තෝපා වැව දාගැබෙන් සොයාගෙන ඇත (Hadi 1966: 10). එහි ද මහාමේරුව පිහිටුවා තිබුණේ කුඩා රැකුල් ගල් තුනක් මතය. ඒ අනුව එහිදී ද කල්පිත පර්වතය ත්‍රිකූටයකින් නැගෙන බව අදහස් කරන්නට ඇත. දාගැබෙහි ධාතු ගර්භය මැද මහාමේරුව නිරූපණය කරන ගලක් තැන්පත් කිරීම ස්තූපය විශ්වය සළකා කෙරෙන සංකේතයක් බවට සාක්ෂියක් වෙතැයි මහාචාර්ය ඒ. ඇම්. හොකාට් මහතා ද ප්‍රකාශ කර තිබේ (Paranavithana 1963:19 ). ලලාට ධාතුවංසයේ සේරුවාවිල ධාතුගර්භය ගැන සඳහන් කරන තැන මැණික් වර්ග සතරකින් නිමවන ලද මහාමේරු ගලක් ධාතු ගර්භය මැද පිහිට වූ බව කියයි (Paranavitharana 1963 : 20 ). මහාමේරු ගල මුදුනෙහි ශක්‍ර දේවේන්ද්‍රයාගේ ආසනයෙහි වැඩ හිඳ දෙවියන්ට ධර්මය දේශනා කරන බුදුන්ගේ රුව දක්වන ලදී. මෙම ග්‍රන්ථයට අනුව ධාතු ගර්භය මැද මහාමේරු ගලක් තැන්පත් කර ඇත්තේ කිසියම් සංකේතයක් හැඟවීමට නොව බුද්ධ චරිතය පිළිබඳ සිද්ධියක් නිරූපණය සඳහා ය. කෙසේ වුවත් පුරාතනයෙහි එබඳු සළකුණු දැක්වීමක් මේ පිළිවෙත හා සම්බන්ධ ව පැවති බවට අදහසක් ගොඩනඟා ගත හැකිය. මිහින්තලය ගරා වැටුණු දාගැබෙහි ධාතු ගර්භය මැද තිබී හමු වූ මහාමේරුව කුමක් අරමුණු කොට ගනිමින් තබන ලද්දේ ද යන්න පිළිබඳ නිශ්චිත යමක් කිව නොහැකිය.

## මිහින්තලා ධාතුගර්භ සිතුවම්හි කාලනිර්ණය.

මිහින්තලා ධාතුගර්භ සිතුවම් වල කාල නිර්ණය ගැන කියැවෙන විස්තරයක් හෝ ඊට ආධාර වන තොරතුරු ස්වල්පයක් ගැන තබා මිහින්තලය පැරණි දාගැබ පිළිබඳ ව පවා ලාංකේය වංසකතාවල කරුණු සඳහන් වී ඇත්තේ ඉතාමත් විරල වශයෙනි. එහෙයින් මේ චිත්‍රවල කාලනිර්ණය පිළිබඳ ගැටලුව විසඳීම නම් කිසිසේත් සුළුපටු කරුණක් නොවේ. මෙම ධාතු ගර්භ චිත්‍රවල කාලනිර්ණය සකස් කර ගැනීමට ආධාර වන කවර හෝ විස්තරයක් කිසිදු සාහිත්‍ය මූලාශ්‍රයකින් හෝ නොලැබුණත් මෙම සිතුවම් ස්තූපයේ අත්තිවාරම දමන ලද කාලයේ ම කරවන්නට ඇති බවට පරණවිතානයන් මත පළකරයි (Paranavithana 1972 : 94 ). ඊට හේතුව වශයෙන් ඔහු ඉදිරිපත් කරන්නේ මෙම සිතුවම් පසුකලෙක අලුත් කළ බවට සාක්ෂි නොතිබීමයි. මෙම මතයට එකඟ වුවහොත් චෛත්‍ය යූපස්ථම්භය ද ධාතු ගර්භය කළ කාලයේම පිහිටුවන ලද්දකැයි සිතීම සාධාරණය. යූපයේ එක් පැත්තක සිංහල "පෙ" අකුර කොටා ඇති අතර එම අක්ෂර කාල නිර්ණය වශයෙන් ක්‍රි.ව අටවැනි සියවසට ගැනේ (චාර්ල්ස් 2000: 11). එය පෙර හෙවත් පෙරදිග යන්නෙහි සංක්ෂේපයක් වශයෙන් යොදා ගත් බවක් පෙනේ. මේ අනුව බලන විට ස්තූපයක්, එහි තිබූ ධාතු ගර්භ චිත්‍රත් අටවැනි සියවසට ගැනෙන බව පිළිගත හැකිය. මිහින්තලා ධාතු ගර්භ චිත්‍ර ක්‍රි.ව 700-800 අතර කාලයෙහි කරන ලද බව සෙනරත් පරණවිතානයන් මෙන්ම ඒ. බී. ධනපාලයන් ද පිළිගෙන තිබේ (සෝමතිලක 2004: 56).

## මිහින්තලා ධාතු ගර්භ සිතුවම්හි වස්තු විෂය.

තත් සිතුවම්වලින් කුමක් නිරූපණය වන්නේ ද යන්න පිළිබඳ ප්‍රමාණවත් කතිකාවතක් මෙතෙක් සිදු වී නොමැත. මූලික වාර්තාකරණයක් සිදු කළ සෙනරත් පරණවිතාන ශූරීන් මිහින්තලා ධාතු ගර්භ සිතුවම් වලින් බුදුන්වහන්සේට වැඳ නමස්කාර කරන දේව සමූහයකගේ රූප නිරූපණය කරන බවට අදහසක් ප්‍රකාශයට පත් කර තිබේ (Paranavithana 1972 : 93 ). මේ සඳහා සිතුවම් මතුපිට ස්වභාවය එනම් දෙ අත් එකට කොට ඉදිරිපස බලා

වැඳ නමස්කාර කරන රූපය සහ සෙසු පරිවාර රූපයන් මෙන්ම ඇඳුම් පැළඳුම්වල ශෛලීත ස්වභාවය පදනම් වී ඇති බවට සැක නැත. එහෙත් පරණවිතානයන්ගේ මෙම සංක්ෂිප්ත කරුණු දැක්වීම වස්තු විෂය පැහැදිලි ව නොකියවෙන මතුපිට කියවීමකි.

එස්.පී චාර්ල්ස් මහතා යටිකය වළාකුළෙන් වැසීගිය දේවරූප මේ චිත්‍රයන්ගෙන් පිළිබිඹු වන බව ප්‍රකාශ කර තිබේ (චාර්ල්ස් 2000: 10). ඒ සඳහා පදනම් වූ නිශ්චිත හේතු දක්වා නැතත් මෙම රූපයන්හි විභූතිමත් රූප සෝභාව, ආභරණ බාහුල්‍ය සහ විශේෂයෙන් නෙළුම් මල් රැගෙන අහසේ පාවෙමින් සිටින ඉරියව්ව දැක්වෙන රූප ඊට හේතු වන්නට ඇතැයි සිතීමට ඉඩ තිබේ. මෙම සිතුවම් පිළිබඳ සිය අදහස ගෙන එන ආර්ය මංජු ශ්‍රී සඳහන් කරන්නේ තත් සිතුවම් මගින් බෝසතුන් සහිත අප්සරාවක් නිරූපණය වන බවය. බෝසත් චරිතය සිතුවමට නැඟීම ඉතා පුරාණයේ සිට පැවත එන සිරිතක් බව හෙතෙම වැඩිදුරටත් සඳහන් කරයි. සිතුවම තුළින් බෝසතුන් නිරූපණය කරන බවට ඔහු සිය මතය ගෙන එන්නට ප්‍රධානම හේතුව වන්නට ඇත්තේ වෘත්තාකාර කොටසක් මැද දෙ අත් එක්කොට ඉදිරිය බලා වඳින විශේෂිත රූපය වන්නට ඇත. වෘත්තාකාර කොටස මැද විශේෂිතව දක්වා ඇති රුවට දෙපසින් දැකිය හැකි සෙසු පරිවාර රූප අප්සරාවන් යැයි මංජු ශ්‍රී ගෙන එන මතය සාධාරණීකරණය කිරීමට සාධක දැකිය හැකි ය. තත් රූපවල මුහුණ, පියයුරු සහ ඇඟිලි තුඩු දක්වා ඇති ආකාරය අනුව අප්සරාවන් යැයි මතයක් ගොඩනැගිය හැකි වුවත්, වෘත්තාකාර කොටසේ දක්වා ඇති දෙ අත් එකට එක් කොට ඉදිරිය බලා සිටින රුව බෝසතුන් යැයි දැක්වීමට තරම් ප්‍රමාණවත් සාධක හඳුනාගත නොහැකි ය. මිහින්තලා ධාතු ගර්භ චිත්‍ර රේඛාත්මක සටහන් පමණක් වන නිසා එවැනි තීරණයකට එළඹීම ද පහසු කටයුත්තක් නොවන බැවිනි. මුහුණෙහි ස්වභාවය, ගෙල, බාහු හා කර්ණවල බැඳි ආභරණ, හිස් පළඳනා, ජෝතිය ආදී බාහිර අලංකරණ සහ ශරීර ප්‍රමාණය දෙස බලන විට සෙසු රූපයන්ට වඩා කිසියම් විශේෂ බවක් තත් රුවෙහි හඳුනාගත හැකි ය. එකී රුව වෘත්තාකාර කොටසක් මධ්‍යයේ විශේෂිත කොට දැක්වීමට නිර්මාණකරුවා පෙළඹීම ද තත් රුව පිළිබඳ ව විශේෂිත යමක් ප්‍රකාශ කිරීමට ගත් උත්සාහයක ඉඟියක් සපයයි. එහෙත් ඒ විශේෂත්වය ම මේ රුව බෝසතුන්ගේ නිරූපණයකැයි කීමට සාක්ෂියක් නොවනු ඇත. ඇතැම් විටක

පරිවාර ජනයා අතර ප්‍රධාන දේවතාවාගේ නිරූපණය මෙමගින් සිදු කළා ද විය හැකි ය.

ආර්ය මංජු ශ්‍රී මුල්කල්ප ගෙන එන අදහස තවදුරටත් විමසා බැලුවහොත් මෙම සිතුවම් හා මහායාන බුදු සමය අතර යම් සබඳතාවයක් පැවතිය හැකි ද යන ගැටලුව මෙහිදී පැන නගියි. ඒවා විමසා බැලිය යුත්තේ තත්කාලීන ආගමික ප්‍රවනතාවයන් හා ඒවා බැඳී වෙනත් සාධක මගිනි. චුල්ලවග්ග පාලියට අයත් සේනාසන බන්ධකයේ ඡබ්බග්ගිය භික්ෂූන් විසින් විහාරයේ චිත්‍රණය කර තිබූ ස්ත්‍රී රූප හා පුරුෂ රූප නිසා විහාර චාරිකාවේ නියුතු මිනිසුන් විසින් භික්ෂූන් හට පරිභව කරන ලද පුවතක් සඳහන් වී ඇත. (චුල්ලවග්ග පාලිය: 23) මේ අනුව මුල්කාලීනව විහාරය තුළ ස්ත්‍රී පුරුෂ රූප චිත්‍රණය නොකළ යුතු බවට නීතිපැනවී ඇති ආකාරයක් ද හඳුනාගත හැකිය. සමන්ත පාසාදිකා විනය අට්ඨ කතාවෙහි ද, ස්ත්‍රී හා පුරුෂ රූප ඇඳීම නොකළ යුතු ස්ථාන පිළිබඳ ව අවධානය කර තිබේ. ක්‍රි.ව 1 වන සියවසේ සිට වරින්වර මහායාන බලපෑම් ලංකාවට එල්ල වූ බවට සාධක පවතී. බෝධිසත්ත්ව සංකල්පයට ප්‍රමුඛස්ථානයක් ලැබුණු මහායාන දර්ශනය තුළ ස්ත්‍රීරූප ප්‍රතික්ෂේප කිරීමක් නොදක්නා ලැබේ. ක්‍රි.ව 05-10 සියවස් අතර මහායාන අදහස් ලක්දිව බෙහෙවින් පැතිර ගොස් ඇත. විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡා වන තත් සිතුවම් දැකිය හැකි මිහින්තලා පුදබිම මධ්‍ය හා පශ්චාත් ඓතිහාසික සමයන් අතරතුර මහායාන බලයට නතු වූ බවට සාධක පවතී. මිහින්තලාවෙන් හමුවන ක්‍රි.ව 07-08 සියවස් වලට ගැනෙන සංස්කෘත ලිපිය සුප්‍රකට මහායාන සංකල්පයක් වූ ත්‍රිකාය වන්දනය එනම් ධර්මකාය, නිර්මාණකාය හා සම්භෝගකාය වන්දනය පිළිබඳ සඳහන් කරන්නකි (Paranavithana 1943 : 243). ක්‍රි.ව 05-07 සියවස් අතරට අයත්විය හැකි ගොනාගොල්ල සහ කරඹගල නිරූපිත සිතුවම්හි (Bandaranayake 1986 : 35, 36, 37 ) සහ ක්‍රි.ව 8-12 සියවස් වලට ගැනෙන කුඩගල (Ibid, 786 : 34) යන ස්ථානයන්හි නිරූපිත සිතුවම් මගින් බෝධිසත්ත්වයන් නිරූපණය වෙතැයි අදහස් ගොඩනැගී ඇත. මෙම සාධක දෙස බලන විට මිහින්තලා ධාතුගර්භ සිතුවම්හි කාල අවකාශය, ශෛලිය අතින් මෙන් ම සංකල්ප අතින් ද අනෙකුත් සිතුවම් හා සාම්‍යයක් පැවතිමට ඉඩ ඇත. මංජු ශ්‍රී මුල්කල්ප ගෙන එන අදහස සත්‍ය නම් මිහින්තලා සංස්කෘත ලිපිය ක්‍රි.ව 07-08 සියවස්වලට ගැනෙන නිසාත්, ධාතු ගර්භ සිතුවම්

හි කාලවකවානුව ඒ කාලපරාසයටම යන බැවින් මෙම සිතුවම් සඳහා මහායාන ආගමෙහි යම් බලපෑමක් අඩු වැඩි වශයෙන් එල්ලවන්නට ඇති බව සිතීම කළ හැකි ය. එහෙත් තත් සිතුවම් වලින් නිරූපණය වන බෝධිසත්තවයන් කවුරුන් ද යන්න පිළිබඳ මූලකල්පයන් අදහසක් ප්‍රකාශ නොකිරීම සැකයට තුඩුදෙන කරුණකි.

## වර්තමාන තත්ත්වය.

මිහින්තලා ධාතුගර්භ සිතුවම්හි නිරූපණය පිළිබඳ පරණවිතාන හා එස්.පී චාර්ල්ස් විසින් වඩා සාධාරණ විස්තරයක් සපයා ඇති බැවින් ඒ පිළිබඳ නැවත විස්තර කිරීම අනවශ්‍යය. එහෙයින් වර්තමානයේ මෙම සිතුවම්වල තත්ත්වය සංක්ෂේපයෙන් මෙහි ඉදිරිපත් කෙරෙයි.

ගර්භයේ බිත්ති 03 ක රතු සහ කහ පැහැති වර්ණ භාවිතා කරමින් කටු සටහන් ස්වරූපයෙන් අඳින ලද සිතුවම්හි වස්තුවිෂය පිළිබඳ යට සඳහන් කෙරිණි. මතවාද කෙසේ වුවත් මෙම සිතුවම්වලින් වලාපටලයන් අතර වන කිසියම් වූ රූප කිහිපයක් නිර්මාණය කර ඇති බවක් බැලූ බැල්මට පෙනී යයි. යටිකය වළාකුලෙන් වැසී ගිය ස්වභාවයක් පෙන්නුම් කෙරේ. මේ සිතුවම්වල දැකිය හැකි විශේෂත්වය වන්නේ ඒවා රේඛා චිත්‍ර වශයෙන් පමණක් ඉදිරිපත් කර තිබීමයි. තවත් ආකාරයකින් කිවහොත් ඇතුළත වර්ණ පිරවීමක් දක්නට නැත. මේ හේතුව නිසාම ගර්භ චිත්‍ර වලින් පැරණි සිංහල චිත්‍ර ශිල්පීන් සිතුවම් ඇඳීමේදී අනුගමනය කළ යම් යම් ශිල්පීය උපක්‍රම අනාවරණය කර ගැනීමට හැකි ය. එනම් ඔවුන්ගේ නිදහස් රේඛා භාවිතය, සිතුවම් සම්පිණ්ඩනය ආදී බොහෝ කරුණු අනාවරණය කර ගැනීමට හැකියාව පවතින නිසා ඉතා දුර්ලභ සිතුවම් කඩක් ලෙස මේ සිතුවම් දැක්විය හැකි ය.

ධාතුගර්භය වූ කලී නිදහස් පරිසරයක් සහිතව සිතුවම් ආදිය ඇඳිය හැකි තැනක් නොවේ. සරලවම කිවහොත් මේ කුඩා ගර්භය හොඳින් අතපය දිගහැර, චිත්‍ර, කරන්නට තරම් තැනක් නොවේ. එය කුඩා ඉඩ ප්‍රමාණයක් සහිත සිතුවම් ඇඳීමට ඉතා අපහසු ස්ථානයකි. එවන් දුෂ්කර තැනක මේ තරම් සියුම් ව සිතුවම් නිර්මාණය කරන්නට සමත් වීම යනු ද එකල ශිල්පීන් සතු වූ

ශිල්පීය දක්ෂතාවය විදහා දක්වන්නකි. තත් සිතුවම් නිර්මාණය කුමන අරමුණක් පදනම් කර ගනිමින් සිදු කළේ ද යන්න පිළිබඳ ව විමසා බැලිය යුතු ය. මිහින්තලය වූ කලී ශ්‍රී ලාංකේය සංස්කෘතියේ කේන්ද්‍රස්ථානයයි. මෙරටට බුදු දහම හඳුන්වා දීමට හේතු වූ මිහිඳු හිමියන් හා දෙවනපෑතිස් රජුගේ ප්‍රථම හමුව සිදු වූ ස්ථානය මිහින්තලා පුදබිමයි. සුවහසක් ශ්‍රී ලාංකේය පිරිස් බෞද්ධාගමට හැරීගිය ස්ථානය තුළ පිහිටි දාගැබක ගර්භගෘහය ඇතුළත සිතුවම් නිර්මාණය කිරීමේදී බුදු දහම කෙරෙහි පැවති ගෞරවය හා භක්ත්‍යාදරය ප්‍රථම කොට සිතන්නට ඇත. ක්‍රි.ව 9-10 සියවස් අතර හමුවන බොහෝ අභිලේඛනවල මෙහි පිනින් බුදු වෙමොවා, මෙපිනින් බුදු වෙම්වා, මෙපිනින් බුද් වෙම්වා, මෙපෙලෙන් බුද් වෙත්වා, මෙහි පෙළෙන් බුද් වෙවා (සේනානායක 2000 : 169) ආදි ප්‍රාර්ථනා දැකිය හැකි ය. ධාතු ගෘහයන් ඇතුළත සිතුවම් බුදු බව පතමින් ඊටම පැවති ගෞරව භක්ත්‍යාදරය හේතු කොටගෙන සිත්තරුන් අතින් නිර්මාණය වුවා විය හැකි ය.

ඇතුළත බිත්තියේ දැකිය හැකි සිතුවම් දෙස පොදුවේ සලකා බලන විට අහසේ පාවෙමින් සිටින දේවතාරූප වල මුහුණු ඉතා පැහැදිලිව දැකිය හැකි ය. දකුණු කණ සහ මුහුණේ වටකුරු සීමාව රේඛා මාත්‍රිකව ශේෂව පවතී. උඩුකය වස්ත්‍රයෙන් සැරසී ඇත. ඇතැම් දේව රූවල පමණක් දකුණු පපු ප්‍රදේශය හරහා වම් උරහිස දෙසට විහිදී යන සළුපට සුළඟට ලෙළ දෙමින් තිබෙන ආකාරයක් නිරූපිත ය. රේඛා තවම හඳුනාගත හැකි මට්ටමක පවතී. අත් පළඳනාවන්, දෝතිය සහ ශීර්ෂාභරණ වල බාහිර රේඛාවන් ඉතා හොඳින් දැකිය හැකි ය. ඉරියව් දක්වා ඇති ආකාරය අනුව මෙම රූපයන් තුළින් දෙවිවරු නිරූපණය කරන බව පෙනේ.

මෙම දේව රූපවල ඉහළට ඔසවන ලද වමත් නිරූපිත ආකාරය ඉසුරුමුණි චිත්‍ර හා දැදිගම සුතිඝර දාගැබ් චිත්‍ර අතර දක්නට ලැබෙන දෙවිවරුන්ගේ අත් නිරූපිත ආකාරයට සමාන බවක් පෙන්නුම් කරයි. මෙම සම්ප්‍රදාය ක්‍රි.ව 8-12 සියවස් අතර කාල පරාසයක විහිදී ගිය බව පෙනේ. තත් රූපවල දකුණු දෙසට හැරී වමත් ඉහළට ඔසවා ගෙන සිටිති (See, Banadaranayake 1986: 76, 79 - Fig 38, 40). ක්‍රි.ව 12 වන සියවසට අයත් තිවංක පිළිමගෙයි අන්තරාලයෙහි දකුණු බිතුතලයෙහි ද එම ඉරියව්වෙන් දෑත් තබා සිටින ස්වරූපය දැකිය හැකි ය. මේ චිත්‍ර වල මෙලෙස අත් දැක්වීමේ සම්ප්‍රදාය දේවරූප විෂයෙහි පොදු

සම්ප්‍රදායක් වන්නට ඇති බව ඉන් පෙනී යයි. තත් සිතුවම්හි දක්නට ලැබෙන සමහර දේවරූපවල වම් අත්ල මත මල් වට්ටියක් වැනි යමක් රඳවාගෙන සිටී. ඇතැම් දේවරූප අත් එකට කොට වැඳ නමස්කාර කරන ආකාරයක් දක්වා ඇත. බොහෝ දේව රූප දකුණතින් නෙළුම් මල් ගෙන සිටී. එම නෙළුම් මල් සමහරක් නොපිපුණු ඒවා වන අතර සමහර නෙළුම් මල් මොහොතකට පෙර විකසිත වූ එකක් වැන්න. රේඛා ප්‍රබල වේගවත් බවකින් යුතුය. එය අවශ්‍ය තැන් වලදී මහත්ව අවශ්‍ය තැන සිහින්ව දිවෙයි. මේවා පැහැදිලිව ම ප්‍රගුණ කරන ලද සම්භාව්‍ය සිතුවම් ශෛලියක නියෝජනයකි. මෙම නෙළුම් මල් පොදුවේ සීගිරි සිතුවම්හි දක්නට ලැබෙන නෙළුම් මල් හා සමාන බවක් දැක්වුවත්, බෙහෙවින් ස්වභාවික හා විස්තරාත්මක ය.

පාවෙන ස්වරූපය විදහා දැක්වෙන යටිකය වළාකුළෙන් වැසීගිය සිතුවම් අනුරාධපුර සමය ආශ්‍රිත ව හමුවී ඇත්තේ ඉතා සීමිත අන්දමිනි. මෙසේ යටිකය වළාකුලෙන් වැසී ගිය සිතුවමක් සීගිරිය ආශ්‍රිත ව සොයා ගැනීමට බෙල් මහතා සමත් වී තිබේ. සිගීරියේ අංක 07 දරණ ගුහාවේ එවැන්නකට නිදසුන් කළ හැකි කාන්තා රුවක් හමු වී ඇති අතර (Paranavithana 1972 : 93 ) එහි ඉඟටියෙහි පහළ ඇඳ ඇති ඉරිවල නියම අර්ථය තේරුම් ගැනීමට මිහින්තලා ධාතු ගර්භ චිත්‍ර වලින් ආලෝකයක් සැපයී තිබේ. මේ ඉරි කෙතරම් අපහැදිලි දැයි කිවහොත් ඒවායින් නාන ඇඳුම් දැක්වීමටත්, දෙපය බෙදූ ඇඳුම් දැක්වීමටත් බොහෝ විද්වතුන් උත්සාහ ගෙන තිබේ (Paranavithana 1972 : 93 ). එහෙත් මේ සිතුවම් මිහින්තලය ධාතු ගර්භ සිතුවම් හා සසඳා බලන විට පැහැදිලිව ම දෙපය බෙදූ ඇඳුම් යයි කියා අරගෙන ඇත්තේ පාවෙමින් එහා මෙහා යන රූපවල ඉදිරිපස කඳු මෙන් ගොඩගැසුණු වළා දක්වන රේඛාවන් බව පැහැදිලි වේ. මෙම පුරාවිද්‍යාත්මක විවරණය 1951 වර්ෂයේ පළකරන ලද පුරාවිද්‍යා වාර්තාවෙහි (ASCAR 1951 : 24) සඳහන් වන ආකාරය පහතින් දක්වා ඇත.

"සිගීරි චිත්‍රයන්හි රූපවල යටිකය වලාකුළින් වැසී තිබෙන පරිදි නිරූපණය කරන ලද්දේ යම් කිසි අදහසක් අරභයා බැව් මේ සිත්තම්වලින් ඔප්පු වෙයි. සිතුවම් තලයෙහි විෂමතාවය හේතු කොටගෙන සීගිරි රූ එලෙස මූර්තිමත් කරන ලද්දේ යැයි සමහර අදහස් කරති. සීගිරි ගල් ලෙන අතිශයින් ජරාවාසව

පිහිටි, නොපැහැදිලි රූපයන්හි යටිකයට පහළින් දැක්වෙන රේඛාවන්ගේ අර්ථය කුමක්දැයි මිහින්තලා චිත්‍රයන්ගෙන් අවබෝධ වෙයි. ඒවායේ අර්ථය නොයෙක් අය විවිධාකාරයෙන් පවසති. සමහරු ඒවායින් නාන ඇඳුම් සරුවාල වැනි මැදින් දෙකට බෙදුනා වූ ඇඳුම් ආදිය දර්ශනය වන්නේ යැයි කියත්. ඒ රේඛා පිළිබඳ ව මිහින්තලා චිත්‍ර ස්ථිර අදහසක් දක්වයි. සරුවාල වැනි දෙකට බෙදුණු ඇඳුම් යයි පැවසීමට හේතු වූ රේඛාවන්ගෙන් දර්ශනය වන්නේ අන් කිසිවක් නොව දෙව්ලොව සැරිසරන දිව්‍ය අප්සරාවන් ඉදිරියෙන් දැක්වෙන සිකර සහිත වලාකුළු වේ."

යට සඳහන අනුව සීගිරි රූපවල පහළ කොටස් වළාකුළුවලින් කැපී ගොස් ඇත්තේ පහළ ගල් බිත්තිය සිලිටු නොවන නිසා යැයි සමහරුන් දක්වන මතය ද මිහින්තලා ධාතු ගර්භ චිත්‍ර දෙස පරීක්ෂාකාරී වීමෙන් ඛන්ඩනය වේ. එය සිතුවම් නිර්මාණය කරන්නාගේ දක්ෂතාවය හෝ පරිකල්පනය මතම සිදු වූවක් විනා පෘෂ්ඨයෙහි මටසිලිටු භාවය මත ගත් තීරණයක් නොවන බව ඉතාමත්ම පැහැදිලි ය.

දකුණු බිත්තියේ දැකිය හැකි කවයක් මත දෙ අත් එක්කොට වැඳ නමස්කාර කරන අයුරු දැක්වෙන රූව සහිත සිතුවම ද සුවිශේෂී සිතුවමකි. කවාකාර කොටසේ තරමක් විශාලව දක්වා ඇති දේවරූපයට අමතරව දෙ අත් එක්කොට වැඳ නමස්කාර කරන තවත් පරිවාර රූවක්, හා ඉරියව් එතරම් පැහැදිලි ව දක්වා නොමැති රූවක් දැකිය හැකි ය. කවයෙන් පිටත දකුණතින් නෙළුම් මල් දෙකක් රැගෙන වමත ඉහළට ඔසවාගෙන සිටින රූවකි. මෙම සිතුවමෙහි කවය ඇතුළත දක්වා ඇති ප්‍රධාන දේව රූපය ඉහළ සිට පහළට සෘජුව අඳින ලද රේඛාවකින් ඛණ්ඩනය වී ඇත. එම සෘජු රේඛාව කවය හරි මැදින් දෙකට බෙදා දක්වයි. සිතුවම් තලය නිසි ලෙස කලමණාකරණය කිරීම සිත්තරාගේ අවශ්‍යතාවය වන්නට ඇත. ප්‍රධාන රූවෙහි මුහුණු, ශරීරය හා ආභරණවල විස්තරාත්මක ලක්ෂණ රේඛාව මත පදනම් වෙයි. ගෙල වටා දිවෙන මාලය තරමක් විශාලව දක්වා ඇත. අත්බාහු පළඳනාවල විස්තරාත්මක ලක්ෂණ පෙනෙන අතර දකුණු හා වම් කණෙහි වටකුරු තෝඩුව ශේෂව තිබේ. උඩුකය කිසියම් වස්ත්‍රයකින් හා යටිකය දෝතියකින් සැරසී ඇත. හිස් පළඳනාව මගින් රූවට තේජාන්විත බවක් හා සෙසු රූ අතර විශේෂත්වයක් ගෙන දෙන්නට සමත් වී ඇත. මුහුණෙහි හැඩය, දෙඅත් හා බාහු දක්වා ඇති ආකාරයට

දෙවියන් අතර විශේෂ දේවතාවකු ලෙස නිරූපණය කරන්නට ගත් උත්සාහයක් පැහැදිලි ව පෙනේ. තත් සිතුවම කවයක් මත දක්වා තිබීම ද ඒ විශේෂත්වය මතු කරයි. එහෙත් මේ සිතුවමින් නිරූපණය වන විශේෂිත රුව කවරෙකුගේ ද යන්න ස්ථිරව ප්‍රකාශ කිරීමට තරම් ශේෂාත්මක සාධක ප්‍රමාණවත් නැත.

කවාකාර කොටසෙන් පිටත දක්වා ඇති නෙළුම් මල් දෙකක් අතින් ගත් වමත ඉහළට ඔසවන ලද රුව නිශ්චිත වශයෙන් ම අප්සරාවකැයි කීමට ශේෂාත්මක ලක්ෂණ ප්‍රමාණවත් ය. ඇඟිලි තුඩු, දෙඅත් හා පියයුරු දක්වා ඇති ආකාරය කාන්තාවගේ ලාලිත්‍ය මතු කිරීමට සමත් වෙයි. සියලු රූප අහසේ පාවෙමින් සිටින හා නමස්කාර කරන ස්වරූපයක් පෙන්නුම් කර තිබීමෙන් කිසියම් වැදගත් ආගමික අවස්ථාවක් නිරූපිත වෙතැයි සිතිය හැකි ය. එහෙත් ඒ කිනම් ආගමික කටයුත්තක් ද යන්න නිශ්චිත ව ප්‍රකාශ කිරීමට තරම් ප්‍රමාණාත්මක සාධක සිතුවම තුළින් ලැබෙන්නේ නැත.

## සමාලෝචනය

අනුරාධපුර සමයට අයත් සීමිත ධාතු ගර්භ සිතුවම් කිහිපය අතර මිහින්තලය ධාතුගර්භ සිතුවම් කිහිපය වඩා පැරණි ඒවා වීමට ඉඩ ඇත. මෙම බිතු සිතුවම් ශේෂ කිහිපය ථේරවාදි බෞද්ධ සංකල්පය හා එය ක්‍රමිකව විපර්යාසයන්ට බඳුන් වූ ආකාරය කියාපාන සාධක වේ. දැනට මිහින්තලය කෞතුගාකාරයේ තැන්පත් කර ඇති තත් සිතුවම් සියල්ල ආකර්ශනිය හා රිද්මයානුකූල රේඛාවලින් යුක්ත මනස්කාන්ත නිමැවුම් ය. වත්මනෙහි ශේෂව ඇති සිතුවම් ස්වල්පය ඊට හිමිවිය යුතු අවකාශීය සන්දර්භයෙහි පිහිටුවීමට අවශ්‍ය පර්යේෂණාත්මක ඇස ක්‍රියාකාරි වන්නේ නම් එය දිගු කාලීන ආයෝජනයක් වනු ඇත.



*ඡායාරූප අංක 01 ධාතුගර්භය හා මහාමේරු ආකෘතිය*



*ඡායාරූප අංක 02 ධාතුගර්භයේ ඇතුළත බිත්තියේ සිතුවම*




*ඡායාරූප අංක 03 වම'ත බිත්තියේ සිතුවම්*



*ඡායාරූප අංක 04 ධාතුගර්භයේ දකුණ 'ත බිත්තියේ සිතුවම්*





රේඛා සටහන් 01-02. එස්.පී.චාර්ල්ස් මහතා විසින් දක්වා ඇති රේඛා සටහන්

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


කුමාරස්වාමි, ඒ.කේ. 1962. **මධ්‍යකාලීන සිංහල කලා,** පරි. එච්.එම්.සෝමරත්න, කොළඹ : ලංකාණ්ඩුවේ මුද්‍රණාලය,

චාර්ල්ස්, ඇස්.පී. 2000, **පාරම්පරික සිංහල බිතු සිතුවම්**, කොළඹ : මධ්‍යම සංස්කෘතික අරමුදල

**චුල්ලවග්ග පාලි.** කිරිඇල්ලේ ඥාණවිමල හිමි සංස්., 1956, රත්නපුරඃ සත්‍යෝදය මුද්‍රණාලය.

පරණවිතාන, එස්. 1972. **පුරාවිද්‍ය පරියේසණ,** කොළඹඃ මධ්‍යම සංස්කෘතික අරමුදල.

පරණවිතාන, එස්. 1963. **ලංකාවේ ස්තූපය** : ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

බණ්ඩාරනායක, එස්. 1998. **චිත්‍ර කලාවක පරිණාමය, අපේ සංස්කෘතික උරුමය** (ද්විතිය කාණ්ඩය) කොළඹ : මධ්‍යම සංස්කෘතික අරමුදල,

මංජු ශ්‍රී, එල්.ටී.පී. 1977. **ලංකා බිතු සිතුවම් සටහන්,** කොළඹ : ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය.

**මහාවංසෝ (ඌන පූර්ණ සහිතො).** පොල්වත්තේ බුද්ධදත්ත හිමි, සංස්., 1959, කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසේකර, එන් 1964. **පැරණි සිංහල බිතුසිතුවම්,** පරි. ඇස්.ඩී.ටී ක්‍රිසැන්තස්. කොළඹ : ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

**සමන්තපාසාදිකා විනයට්ඨකතා** (පළමුවන කොටස), ඒ සුමංගල හිමි, සංස්., 2003. රාජකීය ආසියාතික සංගමය.

සේනානායක, පී. 2009, **ජේතවන ස්තූප සලපතල මළුවේ අභිලේඛන**, ජේතවන ස්තූප පුරාණය, කොළඹ : මධ්‍යම සංස්කෘතික අරමුදල.

සෝමතිලක, එම්. 2004 **පුරාතන ලංකාවේ චිත්‍ර කලාව,** නුගේගොඩඃ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.

Bandaranayake, S 1986. **The Rock and wall Paintinas of Sri Lanka,** Colombo : Lake House Book Shop.

**Archapological Survey of Ceylon Annual Report** 1951, Ceylon: Government Printer.

Paranavitana , S . 1943. **Four Rock Inscriptions From Vessagiriya, The Trikarastava in an Inscription at Mihinthale, Epigraphia zeylanica,** Vol v, Britoin : Oxford University press

Spens Hardi ,1966 .**A Mannual of Buddhism**.